# කෘෂිකර්ම අමාත්‍යාංශය
# கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ராஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.
80/5,"Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.


මගේ අංකය. / எனது இல. / My No. SMFI/03/D/01/06/2022 ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2022.07. 07

**චක්‍රලේඛ අංක 02/2022**

1. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
4. සභාපති, සීමාසහිත ලංකා පොහොර සමාගම
5. සභාපති, සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම
6. සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
7. සියලුම දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්
8. සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින්

**වී වගාව සඳහා 2022 යල කන්නයේ යූරියා පොහොර බෙදා හැරීම**

2022 යල කන්නයේ වී වගා කර ඇති ගොවීන් සඳහා ඉන්දිය ණය යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන යූරියා මිටියක් රු. 10,000/=ක සහනදායී මුදලට ගොවීන් වෙත බෙදා හැරීම සඳහා, ගරු කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2022.06.10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2022.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අංක 22/0812/514/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව එම සහනාධාර පොහොර බෙදා හැරීම සහ අලෙවිය පහත පරිදි සිදු කළ යුතු වේ.

**01. පොහොර බෙදා හැරීමේදී භාවිතා කළ යුතු නිර්දේශ**

ගොවීන් වෙත පොහොර බෙදා හැරීමේදී කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා 2022.06.29 වන දින ප්‍රකාශයට පත් කරන ලද පහත නිර්දේශ පරිදි කටයුතු කළ යුතු වේ.

1. වියළි හා අතරමැදි කලාප වලට අයත් වාරි ජලයෙන් වගාකරන ලද හා වර්ෂා ජලයෙන් වී වගා කර ඇති දින 60ක් වයස නොපිරුණු වී වගා ක්ෂේත්‍රයන් සඳහා හෙක්. 1කට යූරියා 100kg ක් බැගින් එක් ගොවියකුට උපරිමය හෙක්. 2ක් සඳහා වන සේ ද,
2. තෙත් කලාපයට අයත් වාරි ජලයෙන් වගාකරන ලද හා වර්ෂා ජලයෙන් වී වගා කර ඇති දින 60 ක් වයස නොපිරුණු වී වගා ක්ෂේත්‍රයන් සඳහා හෙක්. 1කට යූරියා 50kg ක් බැගින් එක් ගොවියකුට උපරිමය හෙක්. 2ක් සඳහා වන සේ ද මෙම පොහොර ලබා දෙනු ලැබේ.

**02. ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් පොහොර බෙදා හැරීම**

1. දිස්ත්‍රික්කයේ පොහොර බෙදාහැරීමේ සැලැස්මට අනුව එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට අදාලව ප්‍රවාහනය කළ යුතු පොහොර ප්‍රමාණය අදාල දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி Telephone - 011-2034340; ඊ-මේල් / மின்னஞ்சல் e-mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் Fax - 011-2863497

කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி Telephone - 011-2034300; ඊ-මේල් / மின்னஞ்சல் e-mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் Fax - 011-2868910

නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා විසින් පොහොර සමාගම් දෙක වෙත දැන්වීමෙන් පසුව ඒ ඒ ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට අයත් ප්‍රදේශය තුළ ඉහත නිර්දේශයට අනුව පොහොර මිලදී ගැනීමට රජයේ පොහොර සමාගම් වෙත දැන්වීමට ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් කටයුතු කළ යුතුය. තවද, එකී ඉල්ලීම ඉටු කිරීමේ දී තම මධ්‍යස්ථානය වෙත ගැටලුවකින් තොරව පොහොර ප්‍රවාහනය වන බවට වග බලා ගැනීම සඳහා අදාල රාජ්‍ය පොහොර සමාගම සමඟ එක්ව වැඩපිළිවෙළක් සකස් කර ගත යුතුය.

2. විශේෂයෙන් පොහොර මිලදී ගන්නා ගොවි මහතා ඉහත නිර්දේශවලට අනුව පොහොර ලබා ගැනීමට සුදුස්සකු බව තහවුරු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අමතරව ඒ ඒ කොට්ඨාසයේ කෘෂිකර්ම උපදේශක, ග්‍රාම නිලධාරීවරයා සහ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරන ලද සංවර්ධන නිලධාරියෙකුගේ සහය ලබා ගැනීමට යම් වැඩ පිළිවෙළක් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා සකස් කර ගත යුතුය.
3. වී වගා නොකරන හෝ අදාල වයස් සීමාව ඉක්මවන ලද වී වගා ක්ෂේත්‍රයන් සඳහා මෙම සහනාධාර පොහොර අලෙවි නොකිරීමට ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් සෑම පියවරක්ම ගත යුතුය.
4. පොහොර මිලදී ගත් ගොවීන්ගේ නාමලේඛනය මිලදී ගත් ප්‍රමාණයත් සමඟම එළැඹෙන ඊළඟ දිනයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කිරීමට අදාල ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කටයුතු කළ යුතුය.
5. ගොවීන් වෙත නිකුත් කළ මෙම සහනාධාර යූරියා පොහොර, කිසිදු ආකාරයකින් වෙළඳපොලට විකිණීමට ඉඩකඩක් නොතැබිය යුතු අතර එවැන්නක් සිදුනොවීමට අවශ්‍ය පරිදි ගොවීන් දැනුවත් කිරීමේ වගකීම අදාල කොට්ඨාසයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වෙත පැවරේ.
6. ගොවීන් වෙත පොහොර අලෙවි කිරීමේදී සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුව අනුගමනය කරන මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු අතර එළැඹෙන මස 05 වන දිනයට පෙර එම මුදල කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙත බැර කිරීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කළ යුතුය.

## 03. රාජ්‍ය පොහොර සමාගම් දෙකෙහි කාර්යයභාරය

1. වරායෙන් පොහොර මලු ගත කිරීමේ සිට ගොවිජන සංවර්ධන අදාල ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත පොහොර ආරක්ෂිතව සැපයීම සඳහා රජයේ පොහොර සමාගම් දෙක වගකිව යුතුය.
2. තවද, ඒ ඒ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පොහොර ලබා දීමට නම් කර ඇති රජයේ පොහොර සමාගම, අදාල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරියාගේ විධිමත් ඇණවුම පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ඉල්ලුම් කරන ලද පොහොර ප්‍රමාණය ප්‍රවාහනය කර දිය යුතුය.
3. පොහොර බෙදා හැරීම සඳහා වාහන යොදා ගන්නා ආකාරය පිළිබඳ සියලු විස්තර සමාගම් දෙකෙහි වෙබ් අඩවිවල, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙ හි වෙබ් අඩවියේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කළ යුතුය.
4. කළමනාකරණ/ පරිපාලන වියදම් දැරීම.
   අමාත්‍ය මණ්ඩල තීරණ අංක 22/0812/514/004 මගින් මේ සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන වලින් රාජ්‍ය පොහොර සමාගම් වෙත හිස් පොහොර මළු සඳහා වන වියදම්,වරාය ගාස්තු (ගොඩබෑමේ ගාස්තු,ගුදම් ගාස්තු,රේගු ගාස්තු), ප්‍රවාහන වියදම් (වරායේ සිට හුණුපිටිය දක්වා, හුණුපිටියේ සිට ගොවිජන සේවා මධ්‍යස්ථාන දක්වා),බෑම් හා පැටවීමේ කුලී (පැටවීමේ කුලී - වරාය, බෑම් හා පැටවීමේ කුලී - හුණුපිටිය), ආරක්ෂක හා අනෙකුත් වියදම්, පොහොර මළුගත කිරීම සහ බෑග් සකස් කිරීම, බැංකු ගාස්තු වියදම් වෙන් කරනු ලැබේ.
5. මෙම පොහොර ප්‍රමාණය රජයේ සමාගම් දෙකේ ප්‍රාදේශීය ගබඩා වල ගබඩා කිරීමක් සිදු නොකරන බැවින්, ඒ සඳහා වෙන් කර ඇති පිරිවැය, එම පොහොර ගොවීන් වෙත ලබා දීම සඳහා ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයට දැරීමට සිදු වන පිරිවැය කළමනාකරණය කිරීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත වෙන් කර දෙනු ලැබේ.

## 04. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කාර්යභාරය

1. පොහොර ප්‍රමිතිය තහවුරු කිරීම ,ගබඩා ලියාපදිංචි කිරීම ,තොග පරීක්ෂා කිරීම හා පොහොර බෙදාහැරීමේ කාර්යය විධිමත් ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් සිදු වන්නේ දැයි අධීක්ෂණය

කර මාසිකව අමාත්‍යාංශය වෙත ප්‍රගතිය වාර්තා කිරීම ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ.

2. ඒ සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයට අනුයුක්තව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් සහ ඔවුන් යටතේ වන සංවර්ධන නිලධාරීන් විධිමත් ලෙස යොදා ගැනීමට කටයුතු සැලසුම් කිරීමේ වගකීම ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා වෙත පැවරේ.

3. සහනාධාර මත ලබා දෙන පොහොර නියමිත වගාවට යොදන තෙක් එය රජයේ පොදු දේපලක් සේ සලකා කටයුතු කළ යුතු වේ. රජයේ සහනාධාර යටතේ ගොවි ජනතාවට දෙනු ලබන පොහොර, 1988 අංක 76 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි කරනු ලබන වැරදි පිළිබඳ පනතේ 12 වන වගන්තිය සමඟ කියවිය යුතු 5(අ) වගන්තිය යටතේ පොදු දේපළ වශයෙන් ගැනෙන රජයේ දේපළකි. එබැවින් සහනාධාර මත බෙදා හරිනු ලබන පොහොර අපේක්ෂිත ගොවි ජනතාව විසින් තත්කාර්ය සඳහා පමණක් යොදා ගත යුතු අතර එයින් බැහැර වන අවස්ථාවන්හි දී සංශෝධිත 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහි කරනු ලබන වැරදි පිළිබඳ පනත අදාළ කර ගත යුතු බව දන්වමි. තවද, සහනාධාර මත බෙදා හරිනු ලබන පොහොර සම්බන්ධයෙන් කරනු ලබන වැරදි මැඩලීම සඳහා පොලිස් විමර්ශන සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන එකී විමර්ශන හා නෛතික ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය සහයන් ලබා දෙන ලෙසත් දන්වමි. මෙම කාර්යය ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා, ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා රාජ්‍ය පොහොර සමාගම්වල නිලධාරීන් විසින් සහයෝගයෙන් සිදු කිරීමට වගබලාගත යුතුය.

4. ඒ අනුව මෙම පොහොර වෙළඳපොලේ අලෙවි වීමට කිසිදු ඉඩකඩක් නොතැබීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ ශ්‍රී ලංකා පොලිසිය සමඟ එක්ව කටයුතු කළ යුතු වේ.

මෙරට කෘෂිකර්මාන්තය සම්බන්ධ මෙම ජාතික කර්තව්‍යය සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට මෙම කාර්ය හා සම්බන්ධ සියළුම පාර්ශවයන්හි වගකීම බව කාරුණිකව සිහිපත් කරන අතර එසේ පොහොර සපයාගැනීමේ දී හා බෙදාහැරීමේ දී ප්‍රමාදයන් හා දුෂ්කරතාවයන් වළක්වා ගැනීම සඳහා අදාළ පාර්ශව මනා අවබෝධයකින් හා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

රජය විශාල මූල්‍ය දායකත්වයක් සළසමින් ක්‍රියාත්මක කරන පොහොර සහනාධාර වැඩසටහන මඟින් අපේක්ෂිත කෘෂිකර්මාන්තය සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාවය යන අරමුණු සඵල කර ගැනීමට ඔබගෙන් ලැබෙන දායකත්වය බෙහෙවින් අගය කරමි.

එම්. බී.ආර්. පුෂ්පකුමාර
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත්

| | | | |
|---|---|---|---|
| 1 | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - | කරු. දැ.ගැ.ස. |
| 2 | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කරු. දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීම සඳහා |
| 3 | ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය | - | කරු. අ.ක.ස. |
| 4 | සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - | කරු. අ.ක.ස. |
| 5 | පොලිස්පති,ශ්‍රී ලංකා පොලිසිය | - | කරු. අ.ක.ස. |
| 5 | දිස්ත්‍රික් ලේකම් | - | ඒ ඒ දිස්ත්‍රික්කයේ පොහොර ලබා ගැනීමට නියමිත ගොවීන්ගේ නාමලේඛනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය වෙබ් අඩවියේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය වෙබ් |

| | | | |
|---|---|---|---|
| | | | අඩවියේ පල කිරීමට |
| 6 | ප්‍රාදේශීය ලේකම් | - | නිසි ගොවීන් වෙත පොහොර ලැබුනේ ද නැද්ද යන්න පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් මසක් තුළ දිස්ත්‍රික් ලේකම්වරයා මගින් මෙම අමාත්‍යාංශයට ලැබීමට සැලැස්වීමට කටයුතු කිරීමට |
| 7 | ප්‍රධාන මූල්‍ය නිලධාරී, කෘෂිකර්ම අමාත්‍යාංශය | - | කරු. අ.ක.ස. |
| 8 | අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය | - | කරු. අ.ක.ස. |
| 9 | විගණකාධිපති | - | කරු. දැ.ගැ.ස. |